# අ.පො.ස උසස් පෙළ

# ව්‍යාපාර අධ්‍යයනය



## 7.3: ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විමසා බලයි.

## 7.3 නිපුණතා මට්ටම :

**ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විමසා බලයි.**

## ඉගෙනුම් ඵල :

- ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ හැඳින්වීමක් කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ලැයිස්තුගත කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි.

**අන්තර්ගතය :** ඒ. දයාල් පීරිස්. ගුරුළුගෝමී ම.වි, කළුතර.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank of Sri Lanka)

**හැඳින්වීම:**

1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ 1950 අගෝස්තු 28 වෙනි දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයෙකු ලෙස ක්‍රියාකරනු ලබන කේන්ද්‍රීය ආයතනය වේ.

මෙහි ආරම්භක අධිපතිවරයා ජෝන් එක්ස්ටර් මහතාය.



ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank of Sri Lanka)



**ජෝන් එක්ස්ටර් මහතා.**


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පස් දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලයක් මඟින් මහ බැංකුවේ සංවිධාන කටයුතු සිදු කෙරේ.

**මුදල් මණ්ඩලයේ සංයුතිය**

- මහ බැංකු අධිපති
- මුදල් විෂය භාර අමාත්‍යංශ ලේකම්
- පත්කල සමාජිකයන් තිදෙනා

**අරමුණු:**

**01. ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වාගෙන යාම.**

- දේශිය මුදලේ අගය ස්ථාවරව පවත්වා ගැනීම/ සුරක්ෂිත කිරීම.
- මෙයින් අපේක්ෂා කරන්නේ උද්ධමන හා අවධමන තත්වයන්ගෙන් තොරව ආර්ථිකය පවත්වා ගැනීම.
- උද්ධමනය අඩු මට්ටමක පවතින විට ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වේ.
- තිරසර ආර්ථික වර්ධනයක් හා ඉහල සේවා නියුක්තියක් ඇති කිරීමට මෙය ඉවහල් වේ.

**02. මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වා ගැනීම.**

- ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව මින් අදහස් කරයි.
- මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාව ඇති කිරීම, ස්ථායීතාවට එල්ල විය හැකි තර්ජන හඳුනා ගැනීම හා ඒවා අවම කිරීම තුලින් මූල්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමේ හැකියාව ඇත.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## කාර්යයන්:

### ප්‍රධාන කාර්යයන්.

- මුදල් ප්‍රතිපත්ති මෙහෙයවීම.
- විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙයවීම.
- ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමණාකරණය.
- ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බොදා හැරීම.
- බැංකු හා බැංකු නොවන ආයතන වල අධීක්ෂක ලෙස කටයුතු කිරීම.
- රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු හා මූල්‍ය නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම.
- මහ බැංකුවේ පියවීම් ගිණුම් පවත්වාගෙන යන වාණිජ බැංකුවලට හා ප්‍රාථමික වෙළදුන්ට නිශ්කාශන හා පියවීමේ පහසුකම් සැපයීම.

### නියෝජ්‍යායතන කාර්යයන්.

- රාජ්‍ය ණය කළමණාකරණය.
- විදේශ විනිමය පාලනය.
- කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳව මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.
- සේවක අර්ථසාධක අරමුදල කලමණාකරණය.


Copyright © e-thaksalawa.moe.gov.lk

- **ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය. (ස්ලිප්ස්)**

  **Sri Lanka Inter – Bank payment System (SLIPS)**

  පරිගණක භාවිතා කරමින් බැංකු අතර සිදුවන ගණුදෙනු පියවීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රමය.

  ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබූ මෙම අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ශ්‍රී ලංකා මහ බැංකුවට හා වාණිජ බංකුවලට හවුල් අයිතියක් ඇති සීමා සහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම වෙත පවරා දෙන ලදී.

- **සීමා සහිත ලංකා ක්ලියර් (පෞද්.) සමාගම / Lanka Clear (pvt) Ltd විසින් ඉටුකරන නිශ්කාශන කටයුතු.**

  - චෙක්පත් හා අණකර හුවමාරුව ශුද්ධ ශේෂය ගණනය කිරීම.
  - එම ශුද්ධ ශේෂය මහ බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු වෙත දැනුම් දීම.

**ලංකා ක්ලියර් පුද්ගලික සමාගම විසින් "ලංකාපේ" (Lankapay) යන සන්නම් නාමය යටතේ ගණුදෙනු සඳහා පොදු කාඩ්පතක් හඳුන්වා දී ඇත.**

❖ **ජගත් අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සංනිවේදන ජාලය.**
**(ස්විෆ්ට් සන්නිවේදන ජාලය)**

**(Sri Lanka Worldwide Inter Bank Financial Telecommunication) (SWIFT)**

නවීනතම තාක්ෂණය මත පදනම් වූ ලොව පුරා මූල්‍ය වෙළඳපොලවල් ආවරණය කෙරෙන සන්නිවේදන ජාලයකි.

මෙමඟින් ජාත්‍යන්තර වශයෙන් බැංකු අතර සිදුවන මුදල් පැවරුම් පිළිබඳව කටයුතු කරයි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- **තත්කාලීන දළ පියවීම් පද්ධතිය.**

**Real Time Gross Settlement System – RTGS**

ශ්‍රී ලංකාවේ බැංකු අතර වටිනාකම් අධික ගෙවීම් කාල පමාවකින් තොරව උසස් තාක්ෂණය හා ප්‍රමිතීන් යොදා ගනිමින් පියවීම සඳහා පිහිටුවා ඇති පරිගණක ගෙවුම් ක්‍රමයයි.

ඉතා සුළු කාලයකින් පියවිය හැකි වීම නිසා මෙම ක්‍රමය වැදගත් වේ. මෙය රට තුල ඇති එකම විශාල වටිනාකම් සහිත ජාතික ගෙවීම පද්ධතියයි.

- **ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය.**

**Script less Securities Depository System – SSDS**

මුද්‍රණය කරන ලද සුරැකුම්පත් සහතික භාවිතය වෙනුවට සුරැකුම්පත් මිලදී ගැනීමට හෝ විකිණීමට අදාල ගණුදෙනුවක් කිරීම සඳහා ලේඛණ රහිතව භාවිතා වන ක්‍රමයකි.

මෙය ලංකා (Secure) නමින්ද හඳුන්වයි.

මුද්‍රිත සුරැකුම්පත් ලඟ තබා ගැනීමේදී හා විකිණීමේදී ආයෝජකයාට දැරීමට සිදුවන අවදානම මෙමඟින් අහෝසි වේ.

**RTGS + SSDS = Lanka Settle System**

**ව්‍යාපාර වල සාර්ථකත්වය සඳහා මහ බැංකුවේ කටයුතු ඉවහල් වන ආකාරය:**

- ව්‍යාපාර වල ආයෝජනය කිරීම පිළිබඳ සුරක්ෂිතතාව ඇති කිරීම.
- මූල්‍ය ගණුදෙනු පහසු වීම.
- මූල්‍ය ගණුදෙනු කාර්යක්ෂම වීම.
- මූල්‍ය කටයුතු වල විනිවිදභාවයක් තහවුරු වීම.

**අන්තර්ගතය :** ඒ. දයාල් පීරිස්. ගුරුළුගෝමී ම.වි, කළුතර.
**සැකසුම :** ජේ.ජී.රසංගිකා උදිතානි, පො/සිංහරාජපුර ක.වි. , පොළොන්නරුව.
The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**<u>ප්‍රශ්ණ:</u>**

01. "ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුවල බැංකුකරුවාය." ඉහත අදහස සනාථ කිරීමට හේතුවිය හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

02.

i. ශ්‍රී ලංකා රුපියලේ අගය සුරක්ෂිත කිරීම මෙන්ම මෙරට බැංකු කටයුතු, මූල්‍ය හා ගෙවීම් පද්ධතිය සුරක්ෂිත කිරීමේ වගකීම පැවරී ඇත්තේ ..........................................................................

ii. ශ්‍රී ලංකාවේ බැංකු අතර වටිනාකම් අධික ගෙවීම් කාල පමාවකින් තොරව උසස් තාක්ෂණය හා ප්‍රමිතීන් යොදා ගනිමින් පියවීම සඳහා පිහිටුවා ඇති පරිගණක යෙදවුම් ක්‍රමය ..................................................................

**<u>පිළිතුරු</u>**

01.

❖ වාණිජ බැංකුවල අවසන් ණය දෙන්නා වශයෙන් කටයුතු කිරීම.

❖ වාණිජ බැංකුවලට අවශ්‍ය උපදෙස් හා අනෙකුත් සේවා සැපීයීම.

❖ වාණිජ බැංකුවලට ගෙවීම් හා පියවීම් පහසුකම් සැපයීම.

02.

i. ශ්‍රී ලංකා මහ බැංකුව

ii. RTGS – Real Time Gross Settlement System
තත්කාලීන දල පියවීම් පද්ධතිය


Copyright © e-thaksalawa.moe.gov.lk